## ජපානය නූතන රාජ්‍යයක් බවට පරිවර්තනය වීම

ජපානයේ හුදෙකලා ප්‍රතිපත්තිය 17 වැනි සියවසේ මුල් භාගයේ සිට ම ෂෝගුන්වරුන් විසින් ප්‍රවේශමෙන් පවත්වාගෙන යන ලදී. එහෙත් බටහිර ජාතීන් ඈත පෙරදිග රටවල් සමඟ වෙළෙඳ සබඳතා ඇති කර ගැනීමත් සමඟ ජපානයේ ද හුදකලා බව අත්හැරීමට බල කෙරුණ තත්ත්වයක් උදා විය. 19 වැනි සියවස මැද භාගය වන තෙක් වෙළෙඳාම සඳහා ජපාන දොරටු විවෘත කර ගැනීමට යුරෝපීය ජාතීන් විසින් දරන ලද සියලු ප්‍රයත්න අසාර්ථක විය. අවසානයේ දී මේ කාර්යය සඳහා ඇමරිකා එක්සත් ජනපදය මැදිහත් විය. ඇමරිකාව මේ වන විට ඈත පෙරදිග වෙළෙඳ කටයුතුවල සැලකිය යුතු කොටසක් සිය ග්‍රහණයට ගෙන සිටි බව දැකිය හැකි ය. ක්‍රි.ව. 1800 සිට ඇමරිකානු නැව් ජපන් මුහුදු මාර්ග ඔස්සේ චීනයට යාත්‍රා කෙළේ ය. වාෂ්ප යන්ත්‍ර සවි කළ නැව් භාවිතයට පැමිණීමත් සමග ඉන්ධන, ජලය හා ආහාර පාන ලබා ගැනීමට වරාය පහසුකම් අවශ්‍ය විය.

## බටහිර ජාතීන් සමඟ වෙළෙඳ සබඳතා ඇතිකර ගැනීම

ක්‍රි.ව. 1853 ජූලි මාසයේ කොමදෝරු පියරිගේ දුම් නැව් හමුදාව ටෝකියෝ බොක්කට ඇතුළු විය. පහත දැක්වෙන ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස වොෂින්ටන් රජයෙන් පියරිට උපදෙස් දී තිබිණි.

- ඇමරිකා එක්සත් ජනපදයේ අබලන් වූ නැව් හා ඒවායේ නැවියන් ආරක්ෂා කිරීම
- නැව්වලට ඉන්ධන ජලය හා ආහාර පාන සැපයීම
- නැව් අලුත්වැඩියා කිරීම
- වෙළෙඳාමට අවසර දීම

මෙම ඉල්ලීම් ජපන් පාලකයන් වෙත ඉදිරිපත් කළ ද ඇමරිකානු කොන්සල් ජෙනරාල් හැරිස් ටවුන්ඩ්සෙන්ඩ් මහතා පැමිණෙන තෙක් කිසිදු වෙනසක් සිදු වූයේ නැත. ඔහුට පියරිට මෙන් තුවක්කු සවි කළ නැව් හමුදාවක් නොවී ය. ටවුන්ඩ්සෙන්ඩ් උපායශීලීව ජපන් පාලකයන්ට පහත සඳහන් කරුණු පෙන්වා දුන්නේ ය.

- චීනය යුරෝපීය ජාතීන්ට වෙළෙඳාම සඳහා අවසර නොදුන් බැවින් බ්‍රිතාන්‍යය ඇතුලු යුරෝපීය රටවල් කිහිපයක් චීනය ආක්‍රමණය කළ බව
- ඒ හේතු කොට චීනය තුළ සාමකාමී බවක් නොමැති වූ බව

ජපානය තුළ වෙළෙඳාමට අවසර ලැබුණහොත් වෙළෙඳ කටයුතු සාමකාමීව සිදු කිරීමට හැකි බව ද හෙතෙම පෙන්වා දුන්නේ ය.

ඒ අනුව ක්‍රි.ව. 1858 දී ෂෝගුන්වරුන් සමඟ ගිවිසුමක් ඇති කොට ගැනීමට ටවුන්සෙන්ඩ් සමත් විය. එම එකඟතාව අනුව ජපානයේ වරාය කිහිපයක වෙළෙඳ පහසුකම් ඇමරිකා එක්සත් ජනපදයට ලැබිණි. ගිවිසුමෙන් පසු රටවල් දෙක අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ද ඇති කර ගැනිණි.

එපරිද්දෙන් ජපානයේ දොරටු බාහිර ලෝකයට විවෘත කිරීම නිසා මුලින් ම ඇති වූ ප්‍රතිඵලය නම් ෂෝගුන්වරුන් පාලනය අත්හැරීම ය. රජය නූතන සංකල්ප මත නැවත ප්‍රතිසංවිධානය කිරීම අත්‍යවශ්‍ය වූ බැවින් ෂෝගුන්වරුන් ඉවත් වීම වැදගත් ඓතිහාසික සිද්ධියක් සේ සැලකිය හැකි ය. ඩයිම්යෝවරුන් යටතේ පාලනය වූ බල ප්‍රදේශ හතරකි. චොෂු, සත්සුම, හිශෙන් හා තොස යන අය එම ප්‍රදේශ සතරෙහි නායකයෝ වූහ.

ටොකුගාවා ෂෝගුන්ගේ ආධිපත්‍යය අවසන් කර දැමීමට අවස්ථාවක් උදා කොට ගැනීමට මාන බලමින් සිටි එම ප්‍රාදේශීය පාලකයන් සිව් දෙනාට මෙය කදිම අවස්ථාවක් විය. ඔවුන් විදේශිකයන්ට දැඩි ලෙස විරුද්ධ වූ අතර ටොකුගාවා ෂෝගුන්වරුන් ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ ගිවිසුමක් ඇති කර ගැනීමට එරෙහිව නැඟී සිටියහ. මොවුන් කියා සිටියේ කියෝතෝහි සිටි අධිරාජයා නියම පාලකයා විය යුතු බව ය. යුරෝපීයයන් "ම්ලේච්ඡයන් " සේ සැලකූ ඔවුහු යුරෝපීයයන් ජපානයෙන් නෙරපා දැමිය යුතු කියා සිටියහ.

කෙසේ වෙතත් හැරිස් ටවුන්සෙන්ඩ් ගිවිසුම අත්සන් කොට තිබුණේ අධිරාජයාගේ අනුමැතිය ඇතිව ය. ක්‍රි.ව. 1863 දී සත්සුමගේ භටයන් විසින් ඉංග්‍රීසි ජාතිකයකු ඝාතනය කරන ලදී. එකට එක කිරීමක් වශයෙන් බ්‍රිතාන්‍යය හමුදාව සත්සුමගේ අගනුවරට බෝම්බ දැමී ය. දින කිහිපයකට පසු බ්‍රිතාන්‍යය, ප්‍රංශ, ලන්දේසි හා ඇමරිකානු නාවික හමුදා ෂිමො නොසෙකි නම් ස්ථානයේ දී යුද අභ්‍යාසයක් පවත්වන ලදී. මේ අනුව ඉතා කෙටි කාලයකදී ප්‍රධාන බල ප්‍රදේශ සතරෙහි නායකයෝ ද විදේශිකයන්ට දක්වන සතුරු ආකල්ප ඉවත් කර ගත්හ.

## මෙයිජි ප්‍රතිෂ්ඨාපනය

ෂෝගුන්වරු සිය බලතල සියල්ල ම ක්‍රි.ව. 1867 දී කියෝතෝහි සිටි අධිරාජයාට භාර දුන් හ. හමුදා ජනරාල් පදවිය ෂෝගුන්වරුන් අපේක්ෂා කළ නමුත් එය ද ඔවුන්ට නො ලැබිණි. වසර 700 ක් ජපානය පාලනය කළ ටොකුගාවා පවුල මුළුමනින් ම පහතට හෙළනු ලැබී ය. අධිරාජයාගේ පාලන මධ්‍යස්ථානය කියෝතෝවේ සිට ටෝකියෝ නගරයට (ඊඩෝ) මාරු කරනු ලැබී ය. එහි තිබූ ටොකුගාවා ෂෝගුන්වරුන්ගේ සුවිසල් මන්දිරය අධිරාජයාගේ මාලිගාව ලෙස ප්‍රතිසංස්කරණය කරනු ලැබී ය. මේ ක්‍රියාවලිය මෙයිජි ප්‍රතිෂ්ඨාපනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

මෙයිජි ප්‍රතිෂ්ඨාපනය සිදු වන විට ජපන් අධිරාජයා වූ මුට්ෂුහිතෝ වයස අවුරුදු 15 ක දරුවෙකි. ජපන් ආයතන නැවත ප්‍රතිසංවිධානය කිරීමේ දී ඔහු දැක් වූ දක්ෂතාව විස්මයජනක ය. ඔහුගේ පාලන සමය (1868-1912) "මෙයිජි" ප්‍රබුද්ධ සමය ලෙස හැඳින්වෙයි. ක්‍රි.ව. 1871 දී අධිරාජයා විසින් වැඩවසම් ක්‍රමය අහෝසි කරන ලදී. ඔහුගේ

අදහස අනුව ජපානයේ ඉදිරි ගමනට වැඩවසම් ක්‍රමය බාධාවකි. වාණිජ ආර්ථිකයක් කරා ගමන් කිරීමේ දී වැඩවසම් ආයතන විශාල බාධාවක් බව ද පිළිගත් ඔහු ජපානය ශක්තිමත් ජාතියක් වශයෙන් නංවාලීමට අවංක ආශාවක් තිබේ නම් වැඩවසම් ආයතනවලින් ප්‍රයෝජනයක් නැති බව ද පිළිගෙන තිබිණි. ඒ වෙනුවට වේගයෙන් නවීකරණය වන රටකට ඔබින ආයතන ඇති කළ යුතු බව ඔහුගේ අදහස විය. අධිරාජයාගේ ප්‍රතිසංස්කරණ යටතේ වැඩවසම් වංශාධිපතීන් විසින් භුක්ති විඳින ලද වරප්‍රසාද සියල්ල අත්හැරිය යුතු වූ අතර වැඩවසම් ක්‍රමය යටතේ පාලන කටයුතුවලට සම්බන්ධ වී සිටි නිලධාරීන් නව ආයතනවලට අනුයුක්ත කෙරිණි.

දේශපාලන, ආර්ථික, සාමාජික හා බුද්ධිමය වශයෙන් මෙයිජි සමයේ ඇති වූ සීඝ්‍ර වර්ධනය විප්ලවයක් සේ සැලකිය හැකි ය. මෙම ප්‍රතිසංස්කරණ මහජන උද්ඝෝෂණයක හෝ සමාජයේ පහළ මට්ටමෙන් පැන නැඟුණු කැරැල්ලක හෝ ප්‍රතිඵලයක් නිසා සිදු වූ ඒවා නොවේ. විප්ලවය පාලනය කරනු ලැබුවේ ඉහළ ම නායකයා විසින් ම ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ මඟිනි. ටොකුගාවා සමයේ දී රට එක්සත් කෙළේ දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙනි. එසේ මෙයිජි ප්‍රතිසංස්කරණ සමයේ දී ද ජනතාව තම නායකත්වයට කීකරු ව ඉවසිලිවන්තව ජපානය නව රාජ්‍යයක් කරා පරිවර්තනය වන ආකාරය බලා සිටියහ.

"මෙයිජි" නායකයෝ බලය අල්ලා ගැනීමෙන් පසු බටහිර රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කළහ. එම අධ්‍යයනයෙන් පසුව ජපානයේ ද ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් පිහිටුවිය යුතු යයි නායකයෝ තීරණය කළහ. ඉන්පසු ව්‍යවස්ථාව සම්පාදනය කිරීමට අදාළ දින වකවානු දැක්වෙන නිවේදනයක් නිකුත් කෙරිණි. තෝරා ගත් මණ්ඩලයක් විසින් සකස් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රි.ව. 1889 දී අධිරාජයා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙය ක්‍රි.ව. 1871 දී සකස් කළ ජර්මන් අධිරාජ්‍යයේ ව්‍යවස්ථාව හා සමාන විය.

## මෙයිජි පාලන ක්‍රමය යටතේ සම්පාදනය කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

- එම ව්‍යවස්ථාවෙන් "ඩයට්" (DIET) යනුවෙන් හඳුන්වනු ලබන ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව ස්ථාපිත කෙරිණි.
- මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සාමාන්‍ය ව්‍යවස්ථා කටයුතු අයත් විය.
- මුදල් කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට තිබුණේ සීමිත බලයකි.
- මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්ති ව්‍යවස්ථාවට ඇතුළු කොට තිබිණි.
- ඡන්ද බලය ලැබුණේ ජන සංඛ්‍යාවෙන් 1% තරම් වූ ඉඩම් හිමි ධනවත් පුද්ගලයන්ට පමණි.

- අධිරාජයාගේ බලතල ප්‍රධාන බව පිළිගෙන ඇත.
- අධිරාජයා ත්‍රිවිධ හමුදාවල අධිපතියා වූ අතර විදේශ කටයුතු සියල්ල මෙහෙයවනු ලැබුවේ ද ඔහු විසිනි.
- පාර්ලිමේන්තුව විසින් පනවන ලද අණ පනත් ක්‍රියාත්මක කරනුයේ අධිරාජයාගේ අනුමැතිය ලැබීමෙන් පසුව ය. පාර්ලිමේන්තුව සම්මත කළ පණත් නිෂේධ කිරීමේ බලය ඔහුට තිබිණි.
- ඇමතිවරුන් වගකිව යුතු වූයේ පාර්ලිමේන්තුවට නොව අධිරාජයාට යි.
- පාබල හා ගුවන් හමුදා භාර ඇමතිවරු සෘජුව ම අධිරාජයා සමඟ සබඳතා පැවැත් වූහ.

එපරිද්දෙන් සම්මත කර ගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සුවිශේෂ ලක්ෂණය නම් පැරණි ජපන් සම්ප්‍රදායයේ අංග කිහිපයක් ශේෂ ව තිබීම යි. කොන්ෆියුසියස් දර්ශනය සමඟ බැඳුණු එම සම්ප්‍රදායානුකූල පිළිගැනීම් කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

1. මිනිසා ස්වභාවයෙන් ම අසමාන බවත් පහත් පුද්ගලයා උසස් පුද්ගලයාට යටත් විය යුතු බවත් විශ්වාස කිරීම
2. නීතියෙන් කරන ආණ්ඩුවට වඩා මිනිසා විසින් කරවන ආණ්ඩුව හොඳ බව පිළිගැනීම
3. පුද්ගලයාට වඩා සමාජය වැදගත් ලෙස සැලකීම
4. රාජ්‍යයකට වැදගත් වන්නේ පීතෘමූලික සමාජයක් බව පිළිගැනීම

## මෙයිජි ආණ්ඩුක්‍රමය යටතේ දේශපාලන පක්ෂ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නියෝජිතයන් තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන මැතිවරණ පක්ෂ පදනම මත පැවැත්වීමට නියම විය. ක්‍රි.ව. 1881 දී ජපානයේ ප්‍රථම දේශපාලන පක්ෂය වන ලිබරල් පක්ෂය බිහි විය. තොස ප්‍රදේශයේ වැසියකු වූ ඉටගකි සමුරායි එම පක්ෂය පිහිටුවීමේ පුරෝගාමියා විය. ක්‍රි.ව. 1882 දී හිසෙන් ප්‍රදේශයේ කවුන්ට්වරයා ව සිටි ඔකුමා විසින් ප්‍රගතිශීලි පක්ෂය පිහිටුවන ලදී. ජපානයේ දේශපාලන පක්ෂ පුද්ගලයන් මත ගොඩනැගුණු ඒවා මිස ප්‍රතිපත්ති මත ගොඩනැගුණු ඒවා නොවේ. එබැවින් පක්ෂ වැඩි කලක් නො පැවතිණි.

එපරිද්දෙන් ජපානයේ දේශපාලන ක්ෂේත්‍රයේ ව්‍යවස්ථානුකූල ආණ්ඩුවක් පිහිටුවීම මෙයිජි පාලකයන්ගේ එක් අරමුණක් සපුරා ගැනීමක් විය. ඔවුන්ගේ තවත් අරමුණක් වූයේ ප්‍රබල පාබල හමුදාවක් ගොඩ නැඟීම ය. ඒ අනුව ඔවුහු බ්‍රිතාන්‍ය ක්‍රමය අනුව නාවික හමුදාවක් ද ජර්මන් ක්‍රමය අනුව පාබල හමුදාවක් ද ගොඩ නැඟීමට පියවර ගත්හ.

## මෙයිජි සමයේ ආර්ථික ප්‍රතිපත්තිය

මෙයිජි සමයේ ආර්ථිකයේ සිදු වූ වෙනස් වීම් එකල සිදු වූ දේශපාලන විකාශයට වඩා විශ්මයජනක ය. ටොකුගාවා යුගයේ කෘෂිකාර්මික ජාතියක් වූ ජපානයේ මෙයිජි සමයේ දී වාණිජ කටයුතු ප්‍රමුඛස්ථානය ගෙන ඇත. ඒ අනුව ධනවාදී ආර්ථිකය ක්‍රමයෙන් වර්ධනය විය. නව පාලකයෝ කාර්මීකරණය කෙරේ විශේෂ අවධානය යොමු කළ අතර නවීන තාක්ෂණය මත පදනම් වූ සන්නිවේදන ජාලයක් ඇති කිරීමට කටයුතු කළහ. දුම්රිය මාර්ග, විදුලි සංදේශ මාර්ග, දුරකථන, නැව් තටාකාංගන, නැව්, බැර යන්ත්‍ර සූත්‍ර ආදි නිෂ්පාදනයන් සඳහා රජය ප්‍රයත්න දැරූ අතර ඒ සඳහා පෞද්ගලික අංශය ද ඉදිරිපත් විය. දුම්රිය මාර්ග හා සන්නිවේදනය රාජ්‍යයේ ආරක්ෂාව පතා ආණ්ඩුව යටතේ පවත්වා ගනු ලැබී ය.

ඔබ "මිට්සුයි" සිමෙන්ති හා "මිට්ෂුබිෂි" මෝටර් රථ ගැන අසා ඇතැයි සිතමු. මේ දැවැන්ත සමාගම් දෙක ම ආරම්භ වූයේ මෙයිජි සමයේ ය. මිට්සුයි සමාගම මිස්ට්‍රයි විසින් ද මිට්ෂුබිෂි සමාගම සන්සුමා සමුරායිට සම්බන්ධ අයකු විසින් ද ආරම්භ කරන ලදී.

19 වැනි සියවසේ අග භාගයේ දී හා 20 වැනි සියවසේ මුල් කාලයේ දී ජපානයේ ඇති වූ කර්මාන්ත වර්ධනය බටහිර රටවලට වඩා කිහිප අතකින් වෙනස් විය. නිෂ්පාදන වේගය කෙතරම් දැයි කිවහොත් එක් පරම්පරාවක් තුළ (අවුඃ 20) භාණ්ඩ විශාල අතිරික්තයක් නිෂ්පාදනය කෙරිණි. කාර්මික විප්ලවය බටහිර ලෝකයේ දියුණු තාක්ෂණය සමඟ ජපානයට ආනයනය කිරීම එහි එක් ලක්ෂණයකි.

ජපාන කර්මාන්ත දියුණුවේ සුවිශේෂී ලක්ෂණයක් වූයේ සියලු නිෂ්පාදන වේගයෙන් ඉදිරියට ගමන් කළ ද කම්හල්වලින් බොහොමයක් කුඩා ඒවා වීම ය. බැර කර්මාන්ත සඳහා කම්හල් තිබුණේ ස්වල්පයකි. ක්‍රි.ව. 1930 වන විට ජපානයේ කම්කරු සංඛ්‍යාව මිලියන 6කි. ඉන් 3/4 ක් සේවය කෙළේ සියයකට අඩු පිරිසක් සේවය කරන කම්හල්වල ය. ඇතැම් කම්හල්වල සිටියේ සේවකයන් පස් දෙනෙකු වැනි සුළු සංඛ්‍යාවකි.

## ජපානයේ ව්‍යාප්තිය

නැගෙනහිර ආසියාවට ව්‍යාප්ත වීම ජපානයේ තවත් අපේක්ෂාවක් විය. මෙහිදී ඔවුන්ගේ ප්‍රතිපත්තිය වූයේ ආසියාතික ප්‍රදේශ ජපානය යටතට පත් කර ගැනීම ය.

## කොරියාවේ චීන ජපන් යුද්ධය

ජපානයේ ව්‍යාප්තිය ආරම්භ කළේ කොරියාව තුළ සිය ආධිපත්‍යය පැතිරවීමෙනි. කොරියාව එකල ආසියාවේ ඉතා ම දුප්පත් රාජ්‍යයක් විය. පරිපාලනය අන්ත දූෂිත විය. නොසලකා හැරීම නිසා ගොවීහු අසරණ තත්ත්වයට පත්ව සිටියහ. ජපානය කොරියාව සම්බන්ධයෙන් උනන්දු වූයේ එය ආර්ථික හා යුද්ධෝපාය අතින් වැදගත් ප්‍රදේශයක් වූ බැවිනි. කොරියන් දේශ සීමාවට උතුරින් පිහිටි පැසිපික් සාගරයේ වෙරළබඩ ප්‍රදේශ රුසියානුන් විසින් අල්ලාගෙන තිබිණි. මෙබඳු වාතාවරණයක් පවතිද් දී කොරියාවේ කැරැල්ලක් ඇති විය. එය මර්දනය කිරීමේ නාමයෙන් චීනය හා ජපානය කොරියාවට කඩා වැදුණහ. එමඟින් ක්‍රි.ව. 1895 දී චීනය හා ජපානය අතර යුද්ධයක් ඇති විය.

එම යුද්ධයේ දී ජපානය විසින් චීනය පරාජය කරන ලදී. ජපානය කියා සිටියේ චීනය කොරියාවේ ස්වාධීනත්වය පිළිගත යුතු බව හා යුද්ධයට ගිය වියදම ජපානයට ගෙවිය යුතු බව ය. එසේ ම පෝර්මෝසා, පෙස්කදෝර් දූපත් හා මැන්චූරියාවේ දකුණු කොටසට අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම චීනය විසින් නවත්වා දැමිය යුතු බව ද ජපානයේ නියමය විය. එමඟින් චීනය අභිබවා කොරියාවේ තම බලය පිහිටුවා ගැනීමට ජපානය සමත් විය.

## රුසියන් ජපන් යුද්ධය

රුසියාව කොරියාවේ ප්‍රදේශ කිහිපයක් යටත් කොටගෙන සිටි අතර චීන-ජපන් යුද්ධයෙන් පසුව කොරියාව ආක්‍රමණය කෙළේ ය. ඊට ප්‍රතික්‍රියාවක් වශයෙන් ජපානය ක්‍රි.ව. 1904 දී රුසියාවට ප්‍රහාරයක් එල්ල කෙළේ ය. රුසියාවේ නාවික හා පාබල සේනා පරාජය කළ ජපානය රුසියාව සතුව තිබූ සඛාලින් දූපතේ දකුණු අර්ධය අල්ලා ගත්තේ ය. චීන ජපන් යුද්ධයෙන් පසුව රුසියාව, ප්‍රංශය හා ජර්මනිය යන රටවල් මැන්චූරියාවේ දකුණු කොටසින් ජපානය ඉවත් විය යුතු බව දන්වා සිටියහ. එහි විදේශීය හමුදාවක් සිටීම පීකිං පාලනයේ ආරක්ෂාවට තර්ජනයක් බව ද එම රටවල් කියා සිටියහ. මේ අනුව ජපානය මැන්චූරියාවෙන් ඉවත් වූ වහාම චීනය රුසියාව සමඟ ගිවිසුමක් ඇති කොට ගනිමින් එරටෙහි ආරක්ෂාව සඳහා බව කියමින් මැන්චූරියාව රුසියාවට භාර දුන්නේ ය.

ප්‍රායෝගිකව බලන විට එමඟින් සිදු වූයේ කලින් ජපානය අතට පත් කොට ගෙන තිබූ මැන්චූරියාවේ දකුණු කොටස පමණක් නොව මුළු මැන්චූරියාව ම රුසියන් බලපෑමට ගොදුරු වීමයි. කොරියාව හා මැන්චූරියාව පිළිබඳව කිසියම් එකඟතාවකට

ඒමට ජපානය කෙතරම් උත්සාහ කළ ද සාර් රජුගේ නොසැලකිලිමත් බව නිසා එය අසාර්ථක විය. රුසියාව සමඟ යුද්ධයට යාම අනතුරුදායක බව ජපානය වටහා ගෙන තිබිණි. එහෙත් ජපානය මහා බ්‍රිතාන්‍යය සමඟ ගිවිසුමක් ඇති කොට ගෙන සිටි බැවින් ලොව ප්‍රබලතම නාවුක හමුදාවේ සහාය ජපානයට ලබා ගත හැකි බව දක්නට තිබිණි.

රුසියන් ජපන් යුද්ධයේ දී ඇමරිකා එක්සත් ජනපදය හා මහා බ්‍රිතාන්‍යය ජපානයේ පැත්ත ගත් බැවින් රුසියාව පරාජයට පත් විය. ඇමරිකානු ජනාධිපති රූස්වෙල්ට්ගේ මඟ පෙන්වීම අනුව නිව්හැම්ෂයර්හි පෝර්ට්ස්මවුත් වරායේ දී සාම ගිවිසුමක් ඇති කර ගනු ලැබී ය. ජපානයේ ජයග්‍රහණය නිසා එරට පිබිදීමක් සිදු වූ අතර රුසියාවේ පරාජයත් සමඟ බෝල්ෂෙවික්වරුන්ගේ නැගිටීමෙන් රුසියාව තවත් අසීරු තත්ත්වයකට පත් විය.

රුසියන් ජපන් යුද්ධයෙන් පසු ජපානය උත්සාහ කෙළේ නැති වී ගිය තම ශක්තිය යළි ගොඩනඟා ගැනීමට ය.  ඒ අතරතුර ජපානය රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කොට ක්‍රි.ව. 1910 දී ජපානය විසින් කොරියාව යටත් කොට ගන්නා ලදී. ක්‍රි.ව. 1914 දී පළමු වන ලෝක මහා සංග්‍රාමය ආරම්භ වීමෙන් පසු ජපානයට තම බල ව්‍යාප්තිය සඳහා අවස්ථාව උදා විය. ජර්මානුවන් සතුව පැවති පැසිපික් දූපත් ජපනුන් විසින් අල්ලා ගන්නා ලදී. ඊට අමතරව ආසියා, අප්‍රිකා රටවලට යුද අවි හා උපකරණ විකිණීමෙන්  අතිවිශාල ආදායමක් උපයා ගත් ජපානයේ ආර්ථික වර්ධනය වේගයෙන් ඉහළ ගියේ ය.

## දෙවන ලෝක යුද්ධ සමයේ ජපානය

දෙවන ලෝක මහා සංග්‍රාමයට ඇමරිකා එක්සත් ජනපදය මිත්‍ර පක්ෂයට ද ජපානය අක්ෂ පක්ෂයට ද බැඳී යුද්ධයට සහභාගි වීම සුවිශේෂි ලක්ෂණයක් විය. ජපානය විසින් චීනය ආක්‍රමණය කිරීම ඇමරිකා එක්සත් ජනපදය හෙළා දුටුවේ ය. එපමණක් ද නොව ජපානය සමඟ කළ වෙළෙඳාම සීමා කෙළේ ය. ඇතැම් භාණ්ඩ අලෙවි කිරීමෙන් වැළකී සිටීමට ද සිදු විය. ජපානය චීනයෙන් හා ඉන්දු චීනයෙන් ඉවත් විය යුතු බව ඇමරිකාව කියා සිටියේ ය. ඇමරිකා එක්සත් ජනපදය ජපන් විරෝධී පිළිවෙතක පිහිටා ක්‍රියා කිරීම නිසා පැසිපික් සාගරයේ ඇමරිකා මුර පොළවලට පහර දීමට ජපානය සැලසුම් කරන බව ඔත්තු සේවා මගින්  ඇමරිකාවට අනතුරු අඟවා තිබිණි.

ක්‍රි.ව. 1941 දෙසැම්බර් 7 දින ජපන් ප්‍රහාරක යානා හදිසියේ ම පර්ල් වරායට පහර දුන්නේ ය. එපරිද්දෙන් ම ලෝක යුද්ධයට අවතීර්ණ වූ ජපානය මුල් මාස තුනේ දී විශ්මය ජනක ජයග්‍රහණ කිහිපයක් ලබා ගත්තේ ය. ඇමරිකානුවන් සතු ව තිබූ ගුවාම් බල කඳවුර  තායිලන්තය, මලයාසියාව, සිංගප්පූරුව යනාදිය අල්ලා ගෙන පැසිපික් සාගරයේ රඳවා තිබූ ප්‍රින්ස් ඔෆ් වේල්ස් හා රිපල්ස් යන යුද්ධ නැව් දෙක සිංගප්පූරුව අසල දී ගිල්වා දැමීය. ඉන් පසු බ්‍රිතාන්‍යයට හා ඕලන්දයට යටත් ව තිබූ පෙරදිග ඉන්දියා දූපත් යටත් කොට ගෙන ඕස්ට්‍රේලියාවට පහර දීමට උත්සාහ කෙළේ ය. ජපානය දිගින් දිගට ම අත් කොට ගත් ජයග්‍රණ නවතාලීමට හැකි වූයේ ඇමරිකානු නාවුක හමුදා කොරල් මුහුදු අසල කළ සටනේදී ය.

ජපානයට කොන්දේසි විරහිත ව යටත් වීම හෝ විනාශවීම යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගන්නා ලෙස දැනුම් දෙන ලදී. එහෙත් ජපානයෙන් ඊට පිළිතුරු නො ලැබුණි. ඒ අනුව මෑතක නිෂ්පාදනය කොට තිබූ පරමාණු බෝම්බ දමා ජපානය පරාජය කිරීමට ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති හැරී ටෲමන් තීරණය කෙළේ ය. පොට්ස්ඩෑම් නගරයේ දී හමු වූ බ්‍රිතාන්‍ය අගමැති ක්ලෙමන්ට් ඇට්ලි හා ඇමරිකානු ජනාධිපති හැරී ටෲමන් එකඟ වූ පරිදි ක්‍රි.ව. 1945 අගෝස්තු 6 දින හිරෝෂිමා නගරයට ද ක්‍රි.ව. 1945 අගෝස්තු 9 දින නාගසාකි නගරයට ද පරමාණු බෝම්බ හෙලන ලදී. මින් ලක්ෂයකට අධික ජනතාවක් මිය ගිය අතර නගර දෙක ම සුන්බුන් බවට පත් විය. ක්‍රි.ව. 1945 සැප්තැම්බර් මස 2 දින ජපානය කොන්දේසි විරහිතව යටත් විය.

දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් බරපතල ලෙස හානි වූ රටවලට ආර්ථික වර්ධනය සඳහා ආධාර දීමට මාර්ෂල් සැලැස්ම නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ඇමරිකා එක්සත් ජනපදය කටයුතු සංවිධානය කෙළේ ය. මෙම සැලැස්ම සකස් කරන ලද්දේ ජෝර්ජ් මාර්ෂල් විසිනි. ආර්ථික වශයෙන් බරපතල හානි සිදු වූ රටවල් කොමියුනිස්ට් බලපෑමට යටත් වීමට ඇති ඉඩකඩ නිසා එම රටවල් ඉන් වළකාලීම සඳහා එම රටවලට ආධාර දීම මේ සැලැස්මේ අරමුණ විය. යුද්ධයෙන් විනාශ වී ගිය ජපානයට ද මේ යටතේ ආධාර ලැබිණි.

ජපානය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා සැන්ප්‍රැන්සිස්කෝ නුවර පැවැත් වූ සම්මේලනයට ශ්‍රී ලංකාවේ නියෝජිතයා වශයෙන් සහභාගි වූයේ ජේ. ආර්. ජයවර්ධන මහතා ය. එහිදී ඔහු "නහි වේරේන වේරාණී" යන බුදු වදන ගෙන හැර දක්වමින් වෛරයෙන් වෛරය සන්සිඳෙන්නේ නැති බව දක්වා ජපානයට සමාව දීමට සෙසු ජාතීන් කැමැති කරවා ගැනීමට සමත් විය. එදා සිට ජපානය ශ්‍රී ලංකාවේ ප්‍රබල මිතුරකු බවට පත් වී ඇති අතර කෘතගුණ සැලකීම් වශයෙන් බොහෝ ආධාර උපකාර දෙනු ලැබී ය.

යුද්ධයෙන් විනාශ වූ ජපානය වසර 60 කට ආසන්න කාලයක් තුළ සෑම ක්ෂේත්‍රයක ම අත් කොට ගෙන ඇති දියුණුව විශ්මයජනක ය. ඒ පිළිබඳ තොරතුරු මෙහි 5 වැනි පරිච්ඡේදයෙන් ඉගෙන ගනිමු.

## ශිෂ්‍ය ක්‍රියාකාරකම්

1. ජපානයේ භූගෝලීය ලක්ෂණ පෙන්නුම් කරන සිතියමක් අඳින්න.
2. ජපානයේ වර්තමාන දියුණුව නිරූපණය කරන ඡායාරූප එකතු කරන්න.
3. ජපානය නූතන රාජ්‍යයක් ලෙස නැගී සිටීමේ දී ටොකුගාවා පාලකයන්ගෙන් ඉටු වූ සේවය පැහැදිලි කරන්න.
4. මෙයිජි ප්‍රතිස්ථාපනයේ දී සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මොනවා ද?